# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 245/7A — 1976 දෙසැම්බර් 29 වැනි බදාදා — 1976.12.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී.—බී. 31/71.

**1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත**

**2 වන වගන්තිය යටතේ නියමය**

කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ ඉල්ලීම පිට, වැඩබලන මුදල් අමාත්‍ය, විලියම් නීල් ද අල්විස් වන මම, 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතේ 17 වන වගන්තිය සමඟ කියැවිය යුතු ඒ පනතේ 2 (1) (ආ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි I වන උපලේඛනයෙහි සඳහන් එක් එක් වෙළෙඳ ව්‍යාපාරය සහ ඒ එක් එක් වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන මෙහි II වන උපලේඛනයෙහි සඳහන් දේපළ 1976 දෙසැම්බර් මස විසිනව වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම නියමයෙන් ආණ්ඩුව වෙත සතු කරමි.

නීල් ද අල්විස්,<br>
වැඩබලන මුදල් අමාත්‍ය.

1976 දෙසැම්බර් මස 29 වන දින,<br>
කොළඹ දී ය.

### I වන උපලේඛනය

1. ''ජේ. බී. ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්'' යනුවෙන් හඳුන්වනු ලබන (එහි ලියාපදිංචි කළ කාර්යාලය වැල්ලම්පිටියේ මීතොටමුල්ල පාරේ අංක 133 දරන ස්ථානයේ පිහිටි) සමාගම විසින් කෘත්‍රිම රෙදිපිළි සහ එකී සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයෙහි සඳහන් වෙනත් නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාරය.

2. ''ජේ. බී. ෆිෂිං ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්'' යනුවෙන් හඳුන්වනු ලබන (එහි ලියාපදිංචි කළ කාර්යාලය වැල්ලම්පිටියේ මීතොටමුල්ල පාරේ අංක 133 දරන ස්ථානයෙහි පිහිටි) සමාගම විසින් ධීවර දැල් සහ එකී සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයෙහි සඳහන් වෙනත් නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන වෙළෙඳ ව්‍යාපාරය.

### II වන උපලේඛනය

I වන උපලේඛනයෙහි සඳහන් එක් එක් වෙළෙඳ ව්‍යාපාරය ආණ්ඩුව වෙත සතු කරන ලද දිනයට ඉහතින් ම වූ දිනයෙහි එම වෙළෙඳ ව්‍යාපාරයේ කාර්යයන් සඳහා පාවිච්චි කරන ලද ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු සියලු නිශ්චල දේපළ, සියලු පිරියත, යන්ත්‍ර, උපකරණ හා සවිකිරීම් සහ සියලු චංචල දේපළ.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A——ඒ 24463—4,835 (76/12)